රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 02/99

මගේ අංකය : IX543ඊ/1272/30/III
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ:07.
1999.02.26

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## ජංගම දුරකථන සැපයීම

ජංගම දුරකථන සැපයීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති 1997.08.25 දිනැති අංක 19/97 හා 1997.12.31 දිනැති අංක 19/97(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මෙයින් අවලංගු කරන අතර, ඒ සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. පහත සඳහන් කොන්දෙසි යටතේ කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ට පමණක් සීමාවන සේ ජංගම දුරකථන සැපයීම රජය විසින් අනුමත කර ඇත.

I. රාජකාරි අවශ්‍යතා මත පමණක් ජංගම දුරකථන ඉල්ලුම් කළයුතුය.

II. මාසික බාහිර ඇමතුම් රුපියල් 2000/- ක උපරිමයකට සීමා විය යුතු අතර දුරකථන ඇමතුම් ගාස්තු වලින් 10% ක් නිලධාරියාගෙන් අයකර ගැනිමට හා ඊට වැඩිවන මාසික බාහිර ඇමතුම් ගාස්තු සම්පූර්ණයෙන්ම නිලධාරියා දැරිය යුතුය.

III. පිටතින් ලැබෙන ඇමතුම් ගාස්තු බලපත්‍ර ගාස්තු භාණ්ඩ හා සේවා බදු යනාදි වියදම් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව දැරිය යුතුය.

IV. ජංගම දුරකථන සැපයීම හා සේවාවන් සඳහා වන සියළුම වියදම් ඒ ඒ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුවල මුල්‍ය ප්‍රතිපාදන තුළින් දැරිය යුතුය.

03. මීට අනුකුලව අදාළ මුදල් රෙගුලාසි සංශෝධනය කිරිමට මහා භාණ්ඩාගාරය කටයුතු කරනු ඇත.

04. යම් නිලධාරියෙකුට ජංගම දුරකථනයක් අවශ්‍ය වන්නේ නම් ඊට හේතු සහිතව ඉල්ලීමක් තම රේඛිය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර එය අධ්‍යයනය කර අත්‍යවශ්‍ය බවට නිර්දේශ කරන්නේ නම් පමණක් එම ඉල්ලීම අදාළ ලේකම් විසින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

05. එම ඉල්ලීම රජය විසින් පත් කරනු ලැබ ඇති පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුව වෙත ඉදිරිපත් කර තීරණයක් ලබා දීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

1. රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්
2. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්
3. තැපැල් විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

**පී.ඒ. සේනාරත්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය